135

159

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 06/2007(I)

මගේ අංකය: PA/CS/6/PMAS III/පරි.පුහුණු,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2009 පෙබරවාරි මස 24 වන දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු සහ ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 5:1 වගන්තිය යටතේ පරිගණක හැකියාව විමසන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කරන නිලධාරීන්ට පුහුණු දීමනා ප්‍රතිපූරණය කිරීම.</u>**

මගේ ඉහත සමාංකයෙන් හා 2007 නොවැම්බර් මස 09 දාකමින් නිකුත් කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 06/2007 හි 03(අ) උප ඡේදය ඉවත් කරමි. ඒ වෙනුවට පහත සඳහන් උප ඡේදය ආදේශ කරමි.

02.
"03(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන් පරිගණක දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණය සමත් වූ බවට / ව්‍යවස්ථාවේ 5:1:2 ඡේදය අනුව විභාගය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කරනු ලබන ලිපියක් නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරනු ඇත. ඒ අනුව නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එම දීමනාව ගෙවිය යුතුය. එලෙස ගෙවන මුදල අදාළ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ නියමිත වැඩසටහන සහ ව්‍යාපෘතිය යටතේ ඇති පුද්ගල පඩිනඩි වියදම් සඳහා වෙන් කර ඇති දීමනා යටතේ වැය කිරීමට කටයුතු කළ යුතු වේ."

03. එම චක්‍රලේඛයේ අනෙකුත් උප වගන්තිවල කිසිදු වෙනසක් නොවේ.

04. ඉහත ක්‍රියාමාර්ගය 2009.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු වේ.

05. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

මෙම ~~රාජ්‍ය පරිපාලන~~/රාජ්‍ය....................../
ඒකාබද්ධ....සේවා..................චක්‍රලේඛය / උපදෙස්
~~ලිපිය~~..........20..කුත්..කළ... දින සිට
දැනුම් ... අදාළ කර ගැනීම සඳහා
... අනුමැතිය...2009/12/14...
... කරමි.

..................................................
~~ආයතනික ලේකම්~~ / ~~සහකාර ලේකම්~~ / පරිනි.

බී.පී.පී.එස්.අබේගුණරත්න
බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.